# වෛද්‍ය සැපයීම් අංශය

## භාවිතයෙන් ඉවත් කළ හා අබලි ද්‍රව්‍ය විකිනීම සඳහා මිල ගණන් කැඳවීමට අදාල උපදෙස් පත්‍රිකාව (2026/12/31 දක්වා)

- ලංසු ඉදිරිපත් කළ හැකි අවසාන දිනය 2025. 11.11 දින දක්වා පමණි.
- ලංසු ලේඛන 2025 .11.10 දින පැය 15.00 හෝ ඊට පෙර ලංසු ගාස්තු ගෙවා ලංසු ලේඛන ලබා ගත හැකිය.
- ලංසු ලේඛන වලට අදාල ආපසු නොගෙවන ලංසු ගාස්තුව එක් ලංසුවකට රු.500.00 කි.
- ලංසු ගාස්තු ගෙවීමේ රිසිට් පතේ පිටපත් අදාල ලංසු ලේඛනයට අමුණා ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.
- ලංසු ලේඛන පිටපත් දෙකක් වශයෙන් මුද්‍රා තැබූ කවර දෙකක බහා මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සඳහන් කර එක් කවරයක බහා ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.
- ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ " භාවිතයෙන් ඉවත් කළ හා අබලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම " යනුවෙන් සඳහන් කළ යුතුය.
- ලංසු ලේඛන භාර ගැනීම 2025.11. 11 දින ප.ව. 2.30 න් අවසන් වන අතර, ඊට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මෙම සේවාව පවත්වාගෙන යාමට තෝරාපත් කරගනු ලබන ආයතනය විසින් කාර්ය සාධන බැදුම්කරයක් ලෙස රු 25,000.00 ක මුදලක් තැන්පත් කල යුතුය. (මෙම මුදල වෛද්‍ය සැපයීම් අංශයේ සරප් වෙත ගෙවිය යුතුය.)
- මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්අවසන් තීරණය අධ්‍යක්ෂ වෛද්‍ය සැපයීම් සතු වන බව සලකන්න.

විශේෂඥ වෛද්‍ය දේදුනු ඩයස්
අධ්‍යක්ෂ (වැ.බ.)
වෛද්‍ය සැපයීම් අංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අධ්‍යක්ෂ,
වෛද්‍ය සැපයීම් අංශය.

වැඩි විස්තර සඳහා ( ගිණුම් ශාඛාව ) 0112694113-4 අමතන්න.

# අබලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම.(2026/12/31 දක්වා)

වෛද්‍ය සැපයීම් අංශයේ පහත සඳහන් භාවිතයෙන් ඉවත් කළ හා අබලි ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. මේ සමඟ ඇති ඇමුණුමේ සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු අතර, එම අයිතම ඒකකයක් මිලදී ගැනීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් වෙන් වෙන් වශයෙන් අතුළත් කර මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාවිතයෙන් ඉවත් කළ හා අබලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"** යනුවෙන් සඳහන් කර 2025.11.11 දිනට පෙර පිටපත් දෙකකින් යුක්තව අධ්‍යක්ෂ , වෛද්‍ය සැපයීම් අංශය, අංක 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ වෛද්‍ය සැපයීම් අංශයේ දෙවන මහලේ සැපයීම් ශාඛාවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැකි බව මෙයින් දන්වමි.

| A | අයිතමයේ නම | ධාරිතාවය | ඒකකය | ප්‍රමාණය (වර්ෂයකට) |
|---|---|---|---|---|
| A1 | හිස් තහඩු බැරල් | ලී 210 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 30) |
| A2 | හිස් තහඩු බැරල් ( පළුදු වූ ) | ලී 210 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 20) |
| A3 | ප්ලාස්ටික් බැරල් | ලී 200 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 10) |
| A4 | ප්ලාස්ටික් ටින් | ග්‍රෑම් 1000 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 120) |
| A5 | යකඩ ටින් | කි.ග්‍රෑම් 15 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 125) |
| A6 | ප්ලාස්ටික් කෑන් | ලී. 20 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 150) |
| A7 | ප්ලාස්ටික් කෑන් | ලී. 25 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 150) |
| A8 | ලී පුස් පැලට් (ඖෂධ බහාලුම් සමග ලැබෙන | 4*4 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 500) |
| A9 | ප්ලාස්ටික් පැලට් ( ඖෂධ බහාලුම් සමග ලැබෙන ) | 4*4 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 100) |
| A10 | රිජිෆෝම් පුස් පැලට් (ඖෂධ බහාලුම් සමග ලැබෙන ) | 4*4 | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 50) |
| A11 | රිජිෆෝම් පෙට්ටි | දිග 1’ පළළ 1’ උස 1’ | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 2500) |
| A12 | රිජිෆෝම් පෙට්ටි | දිග 2’ පළළ 2’ උස 2’ | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 5000) |
| A13 | රිජිෆෝම් පෙට්ටි | දිග , පළළ, උස, 2’ ට වඩා වැඩි | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 7000) |
| A14 | රිජිෆෝම් කැබලි | දිග 1’ පළළ 1’ | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 2000) |
| A15 | රිජිෆෝම් කැබලි | දිග 2’ පළළ 2’ | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 3000) |
| A16 | රිජිෆෝම් කැබලි | දිග , පළළ, 2’ ට වඩා වැඩි | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 2000) |
| A17 | වීදුරු කුප්පි | මිලි 100 දක්වා | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 1000) |
| A18 | වීදුරු කුප්පි | මිලි 100 ට වැඩි | එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 2000) |

| B | අයිතමයේ නම | ධාරිතාවය | ඒකකය | ප්‍රමාණය (වර්ෂයකට) |
|---|---|---|---|---|
| B1 | ප්ලාස්ටික් කුල් පැක් | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 300 Kg) |
| B2 | පොලිතීන් කුල් පැක් | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 3000 kg) |
| B3 | පොලිතීන් කැබලි | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 2000 kg) |
| B4 | කාඩ්බෝඩ් | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 10,000 kg) |
| B5 | ප්ලාස්ටික් පටි (පෙට්ටි ගැට ගැසූ ) | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 1000 Kg) |
| B6 | ටෝනර් / කාට්‍රිජ් | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 50 kg) |
| B7 | ඉවත ලන යකඩ | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 3000 kg) |
| B8 | ඉවත ලන තඹඩු | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 1000 kg) |
| B9 | ඉවත ලන ඇලුමිනියම් | විවිධ | කි.ග්‍රෑම් එකක් | එකතු වන ප්‍රමාණය (දළ වශයෙන් 500 kg) |

ඉහත තොරතුරු වෛද්‍ය සැපයීම් අංශයේ www.msd.gov.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.

මෙම මිල ගණන් පිළිගැනීම, තෝරා ගැනීම හා බලපැවැත්වෙන කාලසීමාව (මාසික/ වාර්ෂික) තීරණය කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතුය. 2025.11.11 දින ප.ව 2.30 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලබන අයට සිය අනන්‍යතාවය ආරක්ෂක අංශයට තහවුරු කර සහභාගී විය හැකිය. 2025.11.11 දින ප.ව 2.00 ට පසුව ලැබෙන ටෙන්ඩර් පත් බාර ගනු නොලැබේ.

විශේෂඥ වෛද්‍ය දේදුනු ඩයස්
අධ්‍යක්ෂ (වැ.බ.)
වෛද්‍ය සැපයීම් අංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අධ්‍යක්ෂ
වෛද්‍ය සැපයීම් අංශය